දඹුල්ල මහා නගර සභාව

-------------------------------

මාතලේ දිස්ත්‍රික්කය

-------------------------

1. මූල්‍ය ප්‍රකාශන

---------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 23 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 29 දින ද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 31 දින ද සභාව වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට දඹුල්ල මහ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරන මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | කසළ දාහකයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂයේ අවසානයට ණයහිමි ශේෂය රු.334,892 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | නාගරික ආයුර්වේද මධ්‍යස්ථානයේ තොග ශේෂය රු.24,810 ක් වැඩියෙන් දක්වා තිබුණි. | තොග ශේෂය නිවැරදි කර ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | කවශිමා යන්ත්‍ර ගොඩනැගිල්ල, කොම්පෝස්ට් යන්ත්‍ර පද්ධතිය හා ඒ ආශ්‍රිත අනිකුත් ඉදිකිරීම් ස්ථාවර වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වටිනාකම් හඳුනාගෙන ප්‍රාග්ධනිත කිරීම කළ යුතු වේ. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේදී රු.682,105 ක වත්කම් ගබඩාව වෙත ලැබී නොතිබියදී ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. | වරද නිවැරදි කර ගිණුම නිවැරදි කිරීම කළ යුතු වේ. | 2019 වර්ෂයේදී ඇණවුම් කළ බැවින් ගිණුම්ගත කළ බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (v) | සමාලෝචිත වර්ෂය අවසානයේදී ගෙවිය යුතු වැට් ගිණුමේ ශේෂය රු.**659,598** ක් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම නිවැරදි කළ යුතු වේ. | **2020** වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vi) | **2018** දෙසැම්බර් **31** දිනට රු.**16,817,250** ක් වූ ලැබිය යුතු කඩ කුලී කපාහැරීමේ ගිණුම් ශේෂය සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අරමුදල තුළින් ගැලපීම් කර නොතිබුණි. | නිවැරදි ගැලපීම් කළ යුතු වේ. | **2020** වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vii) | ස්ථාවර වත්කම් වල එකතුව හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම අතර රු.**317,522,807** ක වෙනසක් පැවතුණි. | වෙනසට හේතු සොයා නිවැරදි කිරීම කළ යුතු වේ. | **2020** වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ)** නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් **31** දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ **04** ක වටිනාකම හා එම ගිණුම් ශේෂවලට අදාළ උපයෝගී ලේඛනවල ශේෂ අතර රු.**42,742,499** ක වෙනසක් විය. | උපයෝගි ලේඛන හා මූල්‍ය ප්‍රකාශන අගයන් අතර වෙනසක් පැවතිය නොහැකි වන බැවින් උපලේඛන හා මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතු වේ. | **2020** වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ)** ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට වසර **05** කට වැඩි කාලයක සිට ලැබිය යුතුව තිබුණු වරිපනම් වල වටිනාකම රු.**4,866,121** ක් විය. | හිඟ වටිනාකම් අයකර ගැනීම සහාවේ වගකීමක් වේ. | තවදුරටත් පවතින හිඟ මුදල් අයකර ගැනීමට **2020** වර්ෂයේ සිට නව වැඩපිළිවෙලක් සකස් කර ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | වසර 05 කට වැඩි කාලයක සිට ලැබිය යුතුව තිබුණු කඩ කුලී රු.9,984,149 ක් විය. | හිඟ වටිනාකම් අයකර ගැනීම සභාවේ වගකීමක් වේ. | තවදුරටත් පවතින හිඟ මුදල් අයකර ගැනීමට 2020 වර්ෂයේ සිට නව වැඩපිළිවෙලක් සකස් කර ඇති බව දන්වමි. |
| (iii) | පෙර වර්ෂ වලට අදාළව අයවිය යුතුව තිබුණු ප්‍රචාරන දැන්වීම් පුවරු ගාස්තු රු.1,128,816 ක් විය. | හිඟ වටිනාකම් අයකර ගැනීම සභාවේ වගකීමක් වේ. | අයකරගත නොහැකි මුදල් කපා හැරීම සඳහා මහ සභා අනුමැතිය ලැබී ඇති බව දන්වමි. |

ගෙවිය යුතු ගිණුම්
--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 04 ක එකතුව රු.113,247,881 ක් වූ අතර වර්ෂ 05 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින ශේෂය රු.87,232,634 ක් විය. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතු වේ. | 2020 වර්ෂයේදී ඇතැම් මුදල් පියවා ඇති බව දන්වමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම
------------------------------------------------------------

තොරතුරු ඉදිරිපත් නොකිරීම
---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.215,291,866 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළව සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | සාක්ෂි සහිතව වත්කම් පවත්වා ගත යුතු වේ. | සාක්ෂි සහිතව නිවැරදි ලේඛන පවත්වා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

1.4 අනුකූල නොවීම

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| i. **XIX** පරිච්ඡේදයේ **5.3.1** වගන්තිය | නාගරික කොමසාරිස්වරයාට මහා නගර සභාව විසින් සපයා තිබූ නිල නිවාසය සඳහා වැටුපෙන් අයකිරීම් කර නොතිබුණි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව නිවාස කුලී අයකිරීම මහා නගර සභාවේ ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වේ. | නිවාස කුලී අයකර ගැනීම සඳහා නාගරික කොමසාරිස් වෙත ලිපි මඟින් දන්වා ඇති බව දන්වමි. |
| ii. **VIII** පරිච්ඡේදයේ **9.10.1** හා **10.2** වගන්තිය | දිනකට පැය **08** කට නොඅඩු කාලයක් සේවය කළ බවට පැමිණීම හා පිටවීම සම්බන්ධයෙන් ලේඛනගත සාක්ෂියකින් තොරව නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. | ආයතන සංග්‍රහය හා චක්‍රලේඛ අනුව නිවාඩු දින වැටුප් ගෙවීම කළ යුතු වේ. | අනුමත නිවාඩු දින රාජකාරි සඳහා නගරාධිපතිගේ අනුමැතිය ලැබී ඇති බව දන්වමි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| i. මුදල් රෙගුලාසි **104** | නගර සභාව සතු වාහන **05** කට අදාළව සිදුවී ඇති අනතුරු සම්බන්ධයෙන් පරීක්ෂා කර වගකිව යුත්තන් නිශ්චය කර නොතිබුණි. | අලාභයට වගකිව යුත්තන් නිශ්චය කිරීම ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වේ. | අනතුරු සම්බන්ධයෙන් නඩු කටයුතු සිදුවන බව දන්වමි. |
| ii. මුදල් රෙගුලාසි **1644** | නගර සභාව සතු වාහන **21** ක ධාවන සටහන් විධිමත් පරිදි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ධාවන සටහන් නියමිත දිනට ඉදිරිපත් කළ යුතුවේ. | වාහන ධාවන සටහන් නිවැරදිව ලබා දීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | **2008** ජුනි **06** දිනැති **13/2008** අංක දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ **04** වන වගන්තිය | නාගරික කොමසාරිස්වරයා මාසික ඉන්ධන සීමාව ඉක්මවා අතිරේක ඉන්ධන ලබාගෙන තිබුණු අතර එම අතිරේක ඉන්ධන ප්‍රමාණයට අනුපාතිකව වාහනය ධාවනය කර නොතිබුණි. | ඉන්ධන පාරිභෝජනය නිවැරදි බවට වාහන භාර නිලධාරින් වග බලාගත යුතු අතර නිල වාහන සඳහා අතිරේක ඉන්ධන ලබා ගැනීමේදී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඈ) | **2016** දෙසැම්බර් **29** දිනැති අංක **03/2016** දරන චක්‍රලේඛයේ **03** වන වගන්තිය | වාහන **18** ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව වාහන ඉන්ධන පරීක්ෂාවන් සිදුකළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

1.4.2 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නොදන්වා සේවයට වාර්තා නොකළ බව පැමිණීමේ හා පිටවීමේ ලේඛන මඟින් සනාථ වී තිබියදීත් සේවකයින් දෙදෙනෙකුට රු.**32,032** ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම මුදලින් කොටසක් අයවී ඇති අතර ඉතිරි මුදල් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |

2 මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව **2019** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්ථන ආදායම රු.**11,433,711** ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්ථන ආදායම රු.**17,358,025** ක් විය.

2.2 **මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුමකට අදාළව **2018** වර්ෂයේ ජූනි මස සිට අයිරා ශේෂයක් නිරූපනය වන අතර අයිරා පොලී වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.**762,308** ක් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට එම ගිණුමේ ශේෂය රු.**12,821,930** ක අයිරා ශේෂයක් විය. | දිගින් දිගටම අයිරා ශේෂ පවත්වාගෙන යාම යහපත් මූල්‍ය කළමනාකරණයක් නොවීම නිසා මෙම තත්වය වළක්වා ගැනිම කළ යුතු වේ. | **2020.04.30** දින වන විට අයිරා ශේෂය රු.**8,374,582** ක් දක්වා අවම කරගෙන ඇති බව දන්වමි. |

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 23,300,000 | 12,959,470 | 12,582,035 | 6,408,381 | 4,266,000 | 17,113,916 | 17,863,971 | 6,410,945 |
| කුලී | 18,125,000 | 19,191,140 | 18,385,911 | 12,450,636 | 16,540,000 | 17,183,094 | 19,323,353 | 11,632,488 |
| බලපත්‍ර ගාස්තු | 11,730,000 | 10,139,127 | 10,179,212 | - | 11,590,000 | 7,171,410 | 8,770,598 | 55,886 |
| වෙනත් ආදායම් | 92,943,000 | 56,401,872 | 47,846,685 | 10,327,166 | 31,777,600 | 39,154,881 | 46,313,508 | 8,110,216 |
| එකතුව | 146,098,000 | 98,691,609 | 88,993,843 | 29,186,183 | 64,173,600 | 80,623,301 | 92,271,430 | 26,209,535 |

2.3.2 **වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු හිඟ වරිපනම් ආදායම රු.**6,408,382** ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වමි. |

2.3.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට බස්නැවතුම්පල හා තොග පොල කඩකාමර වලින් හිඟ කුලී වශයෙන් රු.12,126,636 ක් ලැබිය යුතුව තිබුණු අතර පසුගිය වර්ෂයේ හිඟ කුලිය හා සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම් එකතුව වන රු.16,677,293 කින් වර්ෂය තුළ අයකර තිබුණේ සියයට 27 ක් වන රු.4,557,291 ක් පමණි. | හිඟ අදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

2.3.4 බලපත්‍ර ගාස්තු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන කුලී ත්‍රී රෝද රථ 554 කින් ලියාපදිංචි ගාස්තු ලෙස රු.602,250 ක් අයවිය යුතුව තිබුණි. | හිඟ අදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | දඹුල්ල - කල්වරල් හෙරිටේජ් පුද්ගලික සමාගම, දඹුල්ල - මන්ජේ රෙස්ටුරන්ට් හා සඳදිය හෝටලය යන ආයතන වලින් 2015 – 2019 වර්ෂ දක්වා ලැබිය යුතු සියයට 1 දක්වා ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ අදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

2.3.5 වෙනත් ආදායම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහා නගර සභා බල ප්‍රදේශයේ ප්‍රධාන මාර්ග වල සවිකර තිබූ ප්‍රචාරණ පුවරු වලින් ලැබිය යුතු රු.822,400 ක ආදායමක් අයකර නොතිබුණි. | හිඟ අදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | නගර සභාව සතු මස්කඩ සඳහා අයවිය යුතු හිඟ ටෙන්ඩර් ගාස්තුව රු.2,017,057 ක් විය. | හිඟ අදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයේ හිඟ වැසිකිළි ගාස්තු රු.889,581 ක් විය. | හිඟ අදායම් අයකර ගැනීම කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | කවෂිමා ව්‍යාපෘතියට අදාළව කසළ ලබාදෙන ආයතන වලින් 2019 දෙසැම්බර් 31 දිනට රු.254,625 ක මුදලක් අයවිය යුතුව තිබුණි. | හිඟ අදායම් අයකර ගැනීම කඩිනම් කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනිකුත් බලධාරින්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.5,203,800 ක් විය. | හිඟ අදායම් අයකර ගැනීමට කළ යුතු වේ. | මුද්දර ගාස්තු වලින් රු.5,203,800 ක් තවදුරටත් අයවිය යුතුව පවතින බව දන්වමි. |

2.4 අධිභාර
--------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මා විසින් සමාලෝචිත වර්ෂය තුලදී පනවනු ලැබූ අධිභාර වලට අදාළව තවදුරටත් රු.206,064 ක් අයවිය යුතුව තිබුණි. | අධිභාර අයකරගැනීම කඩිනම් කළ යුතු වේ. | අධිභාර වටිනාකමින් රු.20,000 ක මුදලක් මේ වන විට අයවී ඇති බව දන්වමි. |

3 මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 කාර්ය සාධනය
-----------------

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 10 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර තිබුණු නමුත් ගැසට් පත්‍රයේ පලකර නොතිබුණි. | මහා නගර සභා ආඥා පනත ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා කඩිනමින් පැනවිය යුතු වේ. | කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා මහා සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ඇති අතර නිත්‍යානුකූල බලයකින් යුත් අතුරු ව්‍යවස්ථා බවට පත්කර ගැනීම සඳහා අවශ්‍ය ඉදිරි පියවර ගෙන ඇති බව දන්වමි. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ඇ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සංවර්ධන ව්‍යාපෘති 04 ක් ඉටුකිරීම සඳහා රු.2,967,266 ක මුදලක් වැයකර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කරගෙන නොතිබුණි. | සංවර්ධන ව්‍යාපෘති ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලය තුළදී ඉටුකර ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ඇ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දිගම්පතහ කොම්පෝස්ට් ව්‍යාපෘතියෙන් ජනනය වන කොම්පෝස්ට් තොග වශයෙන් අලෙවි කිරීම සඳහා අරලිය ඇග්‍රෝ හෝල්ඩින්ස් ආයතනය සමඟ ගිවිසුම්ගතව තිබුණද කොම්පෝස්ට් විකිණීම සිදුකර නොතිබුණි. | නිෂ්පාදිත කොම්පෝස්ට් අලෙවිය සඳහා ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

**(ඉ)** කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 වර්ෂයේ අනුමත කරන ලද සංවර්ධන ව්‍යාපෘති 28 කට අදාළව 2019 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘති වලට අදාළ කටයුතු කඩිනමින් ආරම්භ කිරිමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

**(ඊ)** ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.35,898,123 ක්ද ව්‍යාපෘතියේ ඉදිකිරිම වෙනුවෙන් රුපියල් මිලියන 250 කට අධික මුදලක් ද වැයකර තිබුණු අතර ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලැබී නොතිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ කරා ව්‍යාපෘතිය මෙහෙයවීම කඩිනමින් කල යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

**(උ)** පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දිගම්පතහ ඝන අපද්‍රව්‍ය ව්‍යාපෘති භූමියට පිටතින් මල අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා, වන අලින් එම ස්ථාන වලින් ස්නානය කිරීමට පිලියමක් ලෙස ඉදිකල යුතු පල්දෝරු පද්ධති ඉදිකිරීම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිමකර නොතිබුණි. | ඉදිකිරීම් කටයුතු කඩිනම් කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

**(ඌ)** තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහා නගර සභාව විසින් තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කරන බවට දක්වා ඇතත් එම ඉලක්කයන් ලගා කර ගැනීම වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනාගෙන සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| i. | සමාලෝචිත වර්ෂය අවසාන වන විට කාර්ය මණ්ඩල තනතුරු 37 ක් පුරප්පාඩු වී තිබුණු අතර කම්කරු තනතුරු 45 ක අතිරික්තයක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමටත් අවශ්‍යතාවය අනුව පමණක් බඳවා ගැනීම කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| ii. | මහා නගර සභාව සතුව ක්‍රියාත්මක වන පෙර පාසලක් නොතිබියදී හා ආරම්භ කිරීමේ පූර්ව සූදානමකින් තොරව පෙර පාසල් පාලිකා තනතුරක් සඳහා බඳවාගෙන ඒ වෙනුවෙන් 2019 සැප්තැම්බර් 16 දින සිට නිශ්කාර්ය වැටුප් ගෙවා තිබුණි. | අවශ්‍යතාවය අනුව පමණක් බඳවා ගැනීම කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | **විනය කටයුතු** | | |
| | සේවයෙන් පහ කර තිබූ සේවකයෙකු ලබාගත් නිවාඩු, වැටුප් රහිත නිවාඩු සේ නොසළකා රු.128,160 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. | ගෙවූ වැටුප් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | **සේවක ණය** | | |
| | මහා නගර සභාවේ සේවයේ නියුතු හා ස්ථාන මාරු වී ගිය සේවකයන්ගෙන් රු.364,087 ක මුදලක් අය විය යුතුව තිබුණි. | හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වමි. |
| (ඈ) | **සේවක ඇප** | | |
| | ඇප තැබිය යුතු නිලධාරින් 07 කගෙන් ඇප ලබා ගෙන නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ඇප තැන්පත් කළ යුතු වේ. | ඇප තැන්පත් මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මෝටර් රථයක් 2019 පෙබරවාරි 11 දින නගර සභාව වෙත රැගෙනවිත් තිබුණද අලුත්වැඩියා කර ධාවනයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | අලුත්වැඩියා කඩිනමින් සිදුකිරීමට නිලධාරින් කටයුතු කළ යුතු වේ. | වාහන අයිතිය පවරා ගැනීමෙන් පසුව අළුත්වැඩියා කටයුතු සිදුකිරීමට නියමිත බව දන්වමි. |

3.3.2 පවරානොගත් වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | නගර සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 07 කට අදාළව අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වමි. |
| (ආ) | දිගම්පතහ කොම්පෝස්ට් අංගනය ස්ථාපිත කර ඇති භූමියේ අයිතිය නගර සභාවට නිරවුල් කරගෙන නොතිබුණි. | ඉඩම් නිරවුල් කිරිම් කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3.3.3 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ධාවනයෙන් ඉවත් කළ වාහන 02 ක අලුත්වැඩියාවන් දීර්ඝ කාලයක් සිදුකර නොතිබීමෙන් එම වත්කම් ඌන උපයෝජිත තත්වයෙන් පැවතුණි. | වාහන අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම වාහන අලුත්වැඩියා කටයුතු සඳහා යොමු කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | දීර්ඝ කාලයක් අබලන් තත්වයේ පැවති ජීප් රථ 02 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අබලන් වාහන අපහරණය කළ යුතු වේ. | සුදුසු පරිදි වාහන අපහරණය කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තිත්තවැල්ගොල්ල ප්‍රදේශයේ රු.1,000,000 ක වටිනාකමකට සායන මධ්‍යස්ථානයක් හා කායවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකර රු.1,00,000 ක් පමණ වටිනා කායවර්ධන උපකරණ සවිකර තිබුණද 2015 වර්ෂයේ සිට භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3.3.4 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බස්නැවතුම්පල හා සිනමා ශාලාවට අදාළව භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. | සියලු අංශ වල භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකළ යුතු වේ. | ඊළඟ වර්ෂයේදී සිනමා ශාලාවේ භාණ්ඩ සමීක්ෂණය සිදු කරන බව දන්වමි. |

3.3.5 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දඹුල්ල මහ නගර සභාව සතුව පවතින වාහන 12 ක් සඳහා වාර්ෂික ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | සියලු වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබා ගත යුතු වේ. | ලියාපදිංචි සහතික ලබා ගැනීමෙන් හා අලුත්වැඩියා කටයුතු වලින් පසු වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

3.4 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහා නගර සභාව සතු වාහන අනතුරට ලක්වීම හේතුවෙන් දරන ලද අලුත්වැඩියා වියදම් හා ලැබුණු රක්ෂණ හිමිකම් අතර වෙනස්කම් තිබීමෙන් නගර සභා අරමුදලට රු.199,286 කින් පාඩු සිදුවී තිබුණු අතර වගකිව යුතු පුද්ගලයන්ගෙන් එම අලාභ අයකරගැනීම සඳහා මුදල් රෙගුලාසි 104 ප්‍රකාර පරීක්ෂණ සිදුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අලාභයට වගකිව යුත්තන් නිශ්චය කර පරීක්ෂණ පවත්වා අලාභ අයකර ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

## 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.** | **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව සැලැස්මක් සකස් කළ යුතු වේ.** | **2020 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරිමට කටයුතු කරමි.** |

### 3.5.2 සැපයීම් හා සේවා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **මාර්ග පිලිසකර කර ගැනීම සඳහා බොරළු කියුබ් 300 ක් ගබඩා කර තබාගැනීම සඳහා මිල ගණන් කැඳවා රු.649,800 ක් ගෙවා තිබුණු අතර මේ සම්බන්ධයෙන් සැපයුම්කරුවන්ගේ මිල ගණන් විමසා ලිපි යැවූ බවට හා මිලදී ගැනීම් ක්‍රියාවලිය ප්‍රසම්පාදන මාර්ගෝපදේශන අනුව සිදුකළ බවට සාක්ෂි නොවීය.** | **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු වේ.** | **අදහස් දක්වා නොමැත.** |

### 3.5.3 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **කවශිමා ව්‍යාපෘති භූමියේ භූමි අලංකරණ කටයුතු පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය විය.** | | |
| | **(i) ඇස්තමේන්තු ගත වටිනාකමින් සියයට 39 ක් වූ රු.732,000 ක වැඩ කොටස් ඉටු නොකර තිබියදී උපදේශන කටයුතු වෙනුවෙන් සම්පූර්ණ මුදලම ගෙවීම් කර තිබුණි.** | **ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.** | **ඇස්තමේන්තුගත මුදලින් සියයට 1 ක් වන සේ ගෙවීම් කටයුතු කිරීමට මහා සභා අනුමැතිය ලැබී ඇති බව දන්වමි.** |

| | | | |
|---|---|---|---|
| | **(ii)** කවශිමා ව්‍යාපෘති භූමියේ උද්‍යාන අලංකරණය වෙනුවෙන් මිලදී ගෙන තිබූ රු.**328,900** ක් වටිනා පැළ වලින් රු.**168,875** ක පැළ ව්‍යාපෘති භූමියේ නොවූ අතර ඇතැම් පැළ නිසි නඩත්තුවක් නොවීමෙන් වියළී යාමට ලක්වී තිබුණි. | නඩත්තු කටයුතු විධිමත්ව සිදු කිරීම හා භාණ්ඩ නියමිතව භාර ගැනීමෙන් පසුව ගෙවීම් කටයුතු කළ යුතු වේ. | මෙම ප්‍රදේශය දැඩි උෂ්ණත්වයක් සහිත ප්‍රදේශයක් බැවින් පැළ විනාශ වීමට ලක්වී ඇති බව දන්වමි. |
| | **(iii)** හණ පැළ **350** ක් පමණ භූමියේ සිටුවා තිබූ අතර තවත් පැළ **200** ක් පමණ එක් ස්ථානයක ගොඩ ගසා තිබුණි. ඒ අනුව භූමිය වෙත ලැබුණු සම්පූර්ණ පැළ ප්‍රමාණය **550** ක් බව තහවුරු වූ අතර හණ පැළ **3000** ක් සඳහා රු.**180,000** ක් ගෙවීම නිසා ලැබී නොතිබුණු හණ පැළ **2450** ක් සඳහා රු.**147,000** ක් වැඩිපුර ගෙවා තිබුණි. | නඩත්තු කටයුතු විධිමත්ව සිදු කිරීම හා භාණ්ඩ නියමිතව භාර ගැනිමෙන් පසුව ගෙවීම් කටයුතු කළ යුතු අතර වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගත යුතු වේ. | මෙම පැළ නියමිත ප්‍රමාණය ලැබී තිබුණද උෂ්ණත්වය හේතුවෙන් විනාශ වී ඇත. ඉතිරි පැළ වල හටගන්නා අංකුර වලින් අලිවැට සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | ව්‍යාපෘති භූමිය වටා රු.**1,101,358** ක වියදමින් තාවකාලික අලිවැටක් ඉදිකර තිබුණු අතර ස්ථිර අලිවැට සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවෙන් රේල්පිලි අඩි **15400** ක් ලබාගැනීම සඳහා **2019** මාර්තු **27** දින අමාත්‍ය මණ්ඩල අනුමැතියද ලබාගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වැඩ ආරම්භ කර නොතිබුණි. | අලිවැට ඉදිකිරීම් කඩිනමින් සිදු කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

## 4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහා නගර සභාවේ අභ්‍යන්තර පාලන හා ගිණුම්කටයුතු වලට ප්‍රමාණවත්ව සහාය වියහැකි පරිදි ස්ථාපනය කළ අභ්‍යන්තර විගණන ඒකකයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයන් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වේ. | සභාව තුළ සුදුසුකම්ලත් නිලධාරියෙකු නොමැති වීම මේ සඳහා හේතු වී ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර කළමනාකරණ හා විගණන කමිටුවේ සාකච්ඡාවට ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන සැලැස්ම විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

**4.3** **විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ කළමනාකරණ කමිටු 02 ක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව විගණන කමිටු පැවැත්විය යුතු වේ. | 2019 වර්ෂයේ නියමිත පරිදි රැස්වීම් පැවැත්වීමට සූදානම් කළ ද අත්‍යාවශ්‍ය කටයුතු හේතුවෙන් යොදාගත් දිනවලදී එම කමිටු පැවැත්වීමට නොහැකි වූ බව දන්වමි. |